# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2082/37 – 2018 අගෝස්තු 01 වැනි බදාදා – 2018.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව උතුර සුළු කොට්ඨාසයේ, අකුරුගොඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/කේඑම්බී/2016/450 හා 2016.11.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0253 ක් පමණ වන ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – අරඹ හෙවත් සිංගප්පුලියාවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0253**

උතුරට: මාර්ගය සහ කේ. ලියනපතිරණ හිමිකම් කියන අරඹ නොහොත් සිංගප්පුලියාවත්ත; නැගෙනහිරට: අමරසේන ලියනපතිරණ හිමිකම් කියන පාළුවත්ත; දකුණට සහ බටහිරට: කේ. ලියනපතිරණ හිමිකම් කියන අරඹ නොහොත් සිංගප්පුලියාවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2016/එච්ඒ/367.
2018 මැයි මස 08 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 561



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*